**ප්‍රධාන ලේකම් කාර්යාලය**
**සබරගමුව පළාත් සභාව**
பிரதான செயலாளர் அலுவலகம்
சபரகமுவ மாகாண சபை
**Office of the Chief Secretary**
**Sabaragamuwa Provincial Council**

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 045 - 2231703
කාර්යාලය / அலுவலகம் / Office: 045 - 2222143, 045 - 2222144, 045 - 2223080, 045 - 2232263
ෆැක්ස් / தொலைநகல் / Fax: 045 - 2222793
විද්‍යුත් තැපෑල / மின்அஞ்சல் / E-mail: chiefsecretary@sg.gov.lk

පළාත් සභා සංකීර්ණය, නව නගරය, රත්නපුර. மாகாண சபைக் கட்டிடத் தொகுதி. புதிய நகரம்-இரத்தினபுரி Provincial Council Complex, New Town, Ratnapura.


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. DCSPT/04/T1/08/03 | ඔබේ අංකය / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2022/02/07 |

සබරගමුව පළාත් සභාවේ සියළුම ආයතන ප්‍රධානීන් වෙත.

## පුහුණු වැඩසටහන්/ වැඩමුළු/ සම්මන්ත්‍රණ සංවිධානයට අදාළ දීමනා.

සබරගමුව පළාත් සභාවේ සියළුම ආයතන වලට පොදු වන පරිදි (පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒ හා සම්බන්ධ ආයතන හැර) පුහුණු වැඩසටහන්/ වැඩමුළු/ සම්මන්ත්‍රණ සංවිධානයට අදාළ දීමනා හා ගාස්තු 2022 ජනවාරි 25 වන දින සිට බලපැවැත්වෙන පරිදි සංශෝධනය කිරීමට සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව ආණ්ඩුකාරවර ලේකම්ගේ අංක GS/ES/7/3/8 හා 2022/02/03 දිනැති ලිපියෙන් දන්වා ඇත.

02. ඒ අනුව එම දීමනා ගාස්තු හා කොන්දේසි පහත පරිදි සංශෝධනය වන බව කාරුණිකව දන්වමි.

| | අයිතමය | අනුමත රේටයන් (රුපියල්) |
|---|---|---|
| 01 | පරිපාලන අධීක්ෂණ දීමනා - එක් දිනක් සඳහා | 1000.00 |
| 02 | සංවිධානය සහ මෙහෙයවීමේ දීමනා - වැඩමුළු දිනක් සඳහා | 750.00 |
| 03 | අධීක්ෂණ දීමනා - එක් දිනක් සඳහා | 600.00 |
| 04 | පුහුණු මධ්‍යස්ථානාධිපති දීමනා - වැඩමුළු දිනක් සඳහා | 450.00 |
| 05 | සහාය කාර්යමණ්ඩල දීමනා - වැඩමුළු දිනක් සඳහා | |
| | I. ආයතන කටයුතු සඳහා | 450.00 |
| | II. ගිණුම් කටයුතු සඳහා | 450.00 |
| 06 | යතුරු ලේඛක/පරිගණක ක්‍රියාකරු/ලිපි පරිගණක ගත කිරීමේ දීමනා (වැඩමුළු දිනක් සඳහා) | 300.00 |
| 07 | කාර්යාල කාර්ය සහායක/කම්කරු දීමනා (වැඩමුළු දිනක් සඳහා) | 200.00 |

| | | |
|---|---|---|
| 08 | සම්පත්දායක දීමනා - පැයක දීමනාව | |
| | I. විශ්ව විද්‍යාලවල,මහාචාර්යවරුන්/ආචාර්යවරුන්/කථිකාචාර්යවරුන් සඳහා | 2500.00 |
| | II. දීප ව්‍යාප්ත සේවාවල විශේෂ ශ්‍රේණියේ නිලධාරින් සඳහා | 2000.00 |
| | III. දීප ව්‍යාප්ත සේවාවල පළමු පන්තියේ නිලධාරීන් සඳහා | 1600.00 |
| | IV. ඉහත I,II,III කාණ්ඩවලට අයත් නොවන අනෙකුත් සම්පත්දායකයින් සඳහා | 1200.00 |
| 09 | ආහාර පාන සහ සංග්‍රහ කටයුතු සඳහා එක් අයෙකුට කරන වියදම | |
| | I. එක් දින වැඩමුළු/වැඩසටහන්/සම්මන්ත්‍රණ සඳහා | 950.00 |
| | II. එක් දිනකට වඩා වැඩි දින ගණනක් පවත්වනු ලබන වැඩමුළු/ වැඩසටහන්/ සම්මන්ත්‍රණ සඳහා | 1350.00 |
| 10 | ලිපිද්‍රව්‍ය - එක් වැඩමුළුවක සහභාගි වන්නෙකු සඳහා | 100.00 |

කොන්දේසි සහ අදාල වන නියමයන්...

අ) ඉහත 02,04,05,06,07 අයිතමයන්හී සඳහන් දීමනා ගෙවීමේදී එක් දිනකදී වැඩමුළු 02ක් පැවැත්වෙන අවස්ථාවක දෙවන වැඩමුළුව සඳහා අදාළ දීමනාවෙන් අඩක් පමණක් එකම අයෙකු වෙනුවෙන් ගෙවීම් කළ හැකි අතර වැඩමුළු 02කට වැඩියෙන් පැවැත්වෙන අවස්ථාවක එක් අයෙකුට උපරිම වැඩමුළු දෙකක් සඳහා පමණක් ගෙවීම් කලහැකිය. ඉහත 01 හා 03 හි දීමනාව ගෙවීමේදි එක් අයෙකුට එක් දිනකදී එක් වැඩමුළුවකට පමණක් ගෙවීම් කළ යුතුය.

ආ) ඉහත 01,02,03,04,05,06,07 අයිතමයන්හි සඳහන් දීමනා ගෙවිය හැක්කේ එක් වැඩමුළුවක් සඳහා එක් අයෙකුට පමණි.

ඇ) අංක 08 අයිතමයේ සඳහන් පරිදි සම්පත්දායක දීමනා ගෙවීමේදී එක් අයෙකු සඳහා එක් දිනකට උපරිම පැය 08 ක් සඳහා ගෙවිය හැකිය. නොවැළැක්විය හැකි හේතුවක් මත පැය 08 ක් ඉක්මවා ගෙවීම් කිරීමට සිදුවන අවස්ථාවන්හි ඒ පිළිබඳව සාධාරණීකරණ වාර්තාවක් සමඟ ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කර පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

ඈ) සම්පත්දායක මණ්ඩලයක් එකමවිට සම්පත්දායකත්වය සපයන අවස්ථාවන්හි පුහුණුවට අදාළ පැය ගණන සම්පත්දායකයින් අතර බෙදා වෙන් කර ගෙවීම් කළ යුතුය. එහිදී එක් අයෙකු සඳහා දිනකට ගෙවිය යුතු උපරිම පැය ගණන පැය 08කි.

ඉ) පුහුණු වැඩමුළු/වැඩසටහන්/සම්මන්ත්‍රණ සඳහා අදාළ ඉහත සියලුම ගෙවීම් ගරු ආණ්ඩුකාරතුමා අනුමත කර ඇති උක්ත දීමනා හා රේටයන්වලට අදාළවන පරිදි අවස්ථානුකූලව සිදුකළ යුතුය. මෙම දීමනා ඉක්මවා යම් ගෙවීමක් කිරීමට සිදුවන්නේ නම් එම ගෙවීම කිරීමට ප්‍රථමව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගත යුතුය.

සුනිල් ජයලත්,
ප්‍රධාන ලේකම්,
සබරගමුව පළාත.

**ප්‍රධාන ලේකම් කාර්යාලය**
**සබරගමුව පළාත් සභාව**
பிரதான செயலாளர் அலுவலகம்
சபரகமுவ மாகாண சபை
**Office of the Chief Secretary**
**Sabaragamuwa Provincial Council**

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary } 045 - 2231703
කාර්යාලය / அலுவலகம் / Office } 045 - 2222143, 045 - 2222144, 045 - 2223080, 045 - 2232263
ෆැක්ස් / தொலைநகல் / Fax } 045 - 2222793
විද්‍යුත් තැපැල / மின்அஞ்சல் / E-mail } chiefsecretary@sg.gov.lk, suniljayalath@gmail.com

පළාත් සභා කාර්යාල සංකීර්ණය, නව නගරය, රත්නපුර. மாகாண சபைக் சட்பிடத் தொகுதி. புதிய நகரம்-இரத்தினபுரி Provincial Council Complex, New Town, Ratnapura.


මගේ අංකය / எனது இல. / My Ref. } DCSPT/04/T1/0/08/03
ඔබේ අංකය / உமது இல. / Your Ref. } ............
දිනය / திகதி / Date } 2022/09/ 14

සබරගමුව පළාත් සභාවේ සියලුම ආයතන ප්‍රධානීන් වෙත.

**<u>පුහුණු වැඩසටහන්/ වැඩමුළු/ සම්මන්ත්‍රණ සංවිධානයට අදාළ දීමනා.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් වූ මගේ සමාංක හා 2022/02/07 දිනැති ලිපිය හා බැඳේ.

02. එම ලිපියේ 02 ඡේදයේ සඳහන්, 2022/01/25 සිට බලපැවැත්වෙන පරිදි අනුමත කර ඇති රේටයන්හි අනු අංක (09), පහත දක්වා ඇති ලෙස 2022/09/01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කිරීම (පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒ හා සම්බන්ධ ආයතන හැර) සඳහා සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාරවර ලේකම්ගේ අංක GS/ES/7/3/08 හා 2022/09/07 දිනැති ලිපියෙන් දන්වා ඇත.

02. ඒ අනුව එම රේටයන් පහත පරිදි සංශෝධනය වන බව කාරුණිකව දන්වමි.

| | අයිතමය | | අනුමත රේටයන් (රුපියල්) |
|---|---|---|---|
| 09 | ආහාර පාන සහ සංග්‍රහ කටයුතු සඳහා එක් අයෙකුට කරන වියදම | | |
| | I. | එක් දින වැඩමුළු/වැඩසටහන්/සම්මන්ත්‍රණ සඳහා | 1300.00 |
| | II. | එක් දිනකට වඩා වැඩි දින ගණනක් පවත්වනු ලබන වැඩමුළු/ වැඩසටහන්/ සම්මන්ත්‍රණ සඳහා | 2000.00 |

සුනිල් ජයලත්,
ප්‍රධාන ලේකම්,
සබරගමුව පළාත.